**සංචාරක සංවර්ධන අරමුදල - 2020**

**------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

සංචාරක සංවර්ධන අරමුදලේ 2020දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 23(4) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංචාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත අංක 02 ට පටහැනිව, බැංකු ගිණුම් දෙක අතර මුදල් ගලායාම් සහ මුදල් ගලාඒම් සැලකිල්ලට ගැනීම හේතුවෙන් සංචාරක සංවර්ධන බදු, අපගමන බදු සහ වෙනත් ලැබීම් වශයෙන් මුදලින් ලද රු.962,402,030 ක වටිනාකම රු.1,111,441,038 ක් ලෙස ද මුදලින් ගෙවූ වෙනත් ගෙවීම් රු.6,150,647ක වටිනාකම රු.155,189,670 ක් ලෙස ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | මෙහිදී සිදුව ඇත්තේ සංචාරක සංවර්ධන බදු මුදල් රැස්කිරීම සඳහා විවෘත කර ඇති 73,104,820 දරණ බැංකු ගිණුමට ඍජු තැන්පතු ක්‍රමය යටතේ සිදුකළ රැස්කිරීම්, මුදල් ගලා ඒමක් ලෙස දැක්වීම සහ අරමුදල ප්‍රධාන රැස්කිරීම් බැංකු ගිණුම වන ගිණුම්අංක 7,122,882 දරණ ගිණුමට සිදුකළ මාරු කිරීම මුදල් ගලායෑමක් ලෙසත් ඉදිරිපත් කිරීමයි. නමුත් විගණන වාර්තාවේ දක්වා ඇති ආකාරයට සිදුව ඇත්තේ මෙම අභ්‍යන්තර ගිණුම් අතර මාරු කිරීම මුදල් ප්‍රවාහයක් ලෙස නොදක්වා ඉතිරි ශුද්ධ ප්‍රවාහයක් වෙන්ව ඉදිරිපත් කිරීමයි.<br>ඒ අනුව ඉදිරි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විගණන වාර්තාවේ පෙන්නවා දුන් පරිදි ඉදිරිපත් කිරීමට එකග වෙමු. | අරමුදලේම ගිණුම් දෙක අතර සිදුවී ඇති මුදල්ගලා ඒම් සහ මුදල් ගලා යෑම් මුදල්ප්‍රවාහ ප්‍රකාශණයට ඇතුලත් කළ නොහැකිවීම. |

**1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූලා‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) ලැබිය යුතු ගිණුම් - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 470,884 | 703,607 | 232,723 | එකගවේ. ශේෂයන් දෙක සැසදීමෙන් අනතුරුව නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියට ගන්නෙමු. | නිවැරදි කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ii)ගෙවිය යුතු ගිණුම් - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 4,675,168 | 3,975,260 | 699,908 | එකගවේ. ශේෂයන් දෙක සැසදීමෙන් අනතුරුව නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියට ගන්නෙමු. | නිවැරදි කිරීමට කටයුතු කළයුතු වීම. |

**1.6 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත | | | |
| (i) III වන පරිච්ඡේදයේ 23(2)(අ)වගන්තිය | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් එකතු කර අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලබන අපගමන බදු ආදායමින්1/3 ක කොටසට අදාලව සමාලෝචිත වර්ෂයේදී සේවා ගාස්තු ලෙස සියයට 2.5 ක් හෙවත් රු.12,551,372 ක් අඩු කර ගැනීම සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සළසා නොතිබුණි. | එකග වේ.කෙසේ නමුත් ඉහත අපගමන බදු අඩු කර ගැනීම,**2.5%** සේවා ගාස්තු අදාලව**2019.01.29** දින **PF/R/4/019** යන ලිපියෙන් මහා භාණ්ඩාගාරය එකග වූ බව දක්වා ඇත.(ඇමුණුම් අංක **2)** | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ii)) 24(3) වගන්තිය | වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති සකස් කර නොතිබුණි. එසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත පරිපාලන වියදම් වශයෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 3,315,209 ක් ගෙවා තිබුණි. | මේ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.(ඇමුණුම් අංක **03**) | පනතේ වගන්ති සංශෝධනය කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ආදායම රු.1,037,291,031 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම රු.3,036,183,143 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආදායමෙහි රු.1,998,892,112 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි අපගමන බදු ආදායම රු.1,983,103,993 කින් අඩු වීම හා සංචාරක සංවර්ධන බදු ආදායම රු.15,788,119 කින් අඩු වී තිබීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා බැංකුවට සෘජුව ප්‍රේෂණය කරන ලද රු. 51,933,332 ක මුදලක් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කරනු වෙනුවට ජංගම වගකීම් යටතේ ඉදිරියට ගෙන එමින් පැවතුණි. | කොවිඩ් වසංගත තත්ත්ව හේතුවෙන් 2020 වසරේ රට අගුලු දැමීමේ කාලය තුළ සේවා සපයන්නන් වෙත ගෙවීම් කිරීමට විකල්පයක් නොතිබූ අතර, බදු මුදල් ගෙවීමට ප්‍රමාද වූ සෑම දිනකම දඩමුදල් අයකර ගැනීමේ ක්‍රමවේදය රට වසා තිබූ කාලය තුල ඉවත් කිරීම සඳහාද අනුමැතියක් ලැබී නොතිබුණි. මෙම තත්වය තුළ ගනුදෙනුකරුවන් අපහසුතාවයට පත් නොකිරීමට, මූල්‍ය අංශය සංචාරක කර්මාන්තයේ සේවා සපයන්නන් හට වෙබ් සහ | බැංකුවට කර ඇති සෘජු ප්‍රේෂණ නිවැරදිව හඳුනා ගෙන ගිණුම් යාවත්කාලීන කිරීමට ක්‍රමවේදයක් ඇති කළ යුතු බව. |

විද්‍යුත් තැපැල් මඟින් මාර්ගගත පහසුකම භාවිතා කරන ලෙස හෝ අප විසින් මේ වන විටත් බෙදා හැර ඇති විශේෂ TDL තැන්පතු පත්‍රය භාවිතා කර සෘජුවම බැංකුවලට ගෙවන ලෙස උපදෙස් දී ඇත. එසේ වුවද, දිවයින පුරා පිහිටි සෑම ලංකා බැංකු ශාඛාවකටම ලබා දී තිබූ විශේෂ TDL තැන්පතු පත්‍ර ප්‍රමාණවත් නොවීය. මේ නිසා බදු ගෙවන්නන් සාමාන්‍ය තැන්පතු පත්‍ර භාවිතා කිරීම හේතුවෙන් සාමාන්‍ය මුදල් තැන්පතු පත්‍රවල ලියාපදිංචි අංකය,නම, අදාළ කාර්තුව ආදිය සඳහන් කිරීමට ඉඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් තැන්පතුවල තැන්පත්කරුගේ විස්තර හඳුනාගැනීමට නොහැකිවූ බැවින් මෙම තත්ත්වය උද්ගත වී ඇති අතර, එම නිසා බදු මුදල් නිවැරදිව හඳුනාගැනීමට නොහැකිවිය. කෙසේ වුවද හඳුනා නොගත් මුදලින් රු.5,168,188 ක් 2021 පෙබරවාරි 3 දින වන විට TDL ලෙස හඳුනාගෙන ඇත.